

අමා ගඟුල

කලාප අංක 314

දෙවිනුවර, කපුගම ශ්‍රී සුධර්මාරාමාධිපති
ශාස්ත්‍රපති පූජ්‍යපාද කපුගම ගරු සුගතසාර ස්වාමීන්වහන්සේ විසිනි

ධර්ම පත්‍රිකාව

කඨින පිංකම නිවන් සම්පත උදාකර ගැනීමට හේතුවක් කර ගනිමු!

ශ්‍රී. බු. ව. 2570 වූ ඉල් මාසය | රා. ව. 2026 නොවැම්බර් මස 24 වන දිනය

කඨින පිංකම නිවන් සම්පත උදාකර ගැනීමට හේතුවක් කර ගනිමු!

නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස !!!

එව මසස එසා උපරිමා දිසා පටිචඡනනා හොති ඛෙමා අපපටිහයාති. මෙසේ ඔහු විසින් උඩ දිසාව වැසූ කල් හි, ක්ෂේම වූත්, අප්පටිහය වූත් තත්වයක් උදා වේ.

(දීඝ නිකාය සිගාලෝවාද සූත්‍රය)

ගරු ස්වාමීන් වහන්ස, කාරුණික පින්වත්නි,

අද ඉල් පුර පසළොස්වක පොහොය දිනයයි. ප්‍රථම වරට භික්ෂූන් වහන්සේලා ධර්මදූත සේවයේ යෙදවීම, බුදුන් වහන්සේ තුන් බෑ ජටිලයින් වෙත වැඩමවීම, මෙත් බෝසතුන් විවරණ ලැබීම, මෙම වසරේ කඨින පූජා පැවැත්වෙන අවසාන දිනය, සැරියුත් හිමියන්ගේ මව මගඵල ලැබීම, සැරියුත් හිමියන් පිරිනිවන් පෑම යන වැදගත් කරුණු රාශියක් සිදුවූයේ අද වැනි ඉල් පුර පොහොය දිනයකයි. එවන් දිනයක මේ සදහම් පණිවිඩයෙන් අපේක්ෂා කරන්නේ කඨින පිංකම සසර කෙටි කරගෙන නිවන් සම්පත උදාකර ගැනීමට හේතුවක් කර ගන්නා හැටි සිහිපත් කර දීමටයි. ප්‍රථම ධර්ම දූතයන් වහන්සේලා ඇමතූ බුදු පියාණන් වහන්සේ දේශනා කළේ ‘‘මහණෙනි, බොහෝ දෙනාගේ හිත සුව පිණිස ධර්මය දේශනා කරමින් චාරිකාවේ හැසිරෙන්න’’ ලෙසටයි. ඒ අවවාදය මත ක්‍රියාකළ භික්ෂූන් වහන්සේලා, අවිව වැස්ස නොබලා ධර්ම ප්‍රචාරක කටයුතුවල යෙදී ක්‍රියා කළහ. වර්ෂා කාලයෙහි නිල් තණ කොළ පාගමින්, කුඩා සතුන් පාගමින් යන මේ ගමනට බොහෝ දෙනා දොස් නැගූහ. ඔවුන් කියා සිටියේ අන්‍ය ආගමික නායකයින් පවා වස් කාලයේදී ස්වකීය ආරාමවලට වී සිටිනා බවත්, කුඩා සතුන් ආහාර ගබඩා කරගෙන තම කුඩුවලම සිටිනා බවත්, නමුත් කෙසේ නම් ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේගේ ශිෂ්‍ය පුත්‍රයින් වහන්සේලා මෙසේ හැසිරෙන්නේද කියාය. ජනතාවගේ මේ අප්‍රසාදය හමුවේ තථාගතයන් වහන්සේ භික්ෂූන් අමතා දේශනා කළේ ‘‘මහණෙනි, ඔබලාගේ දහම් චාරිකාවේ අපිළිවෙල ගැන මිනිසුන් අසතුට පළකර ඇත. පෙන ආගමේ අය තණ කොළවලට පවා පණ ඇතැයි පිළිගෙන තිබේ. ඒ නිසා ඔබ විසින් මින් පසුව එන වස් කාල තුළ ස්වකීය ආරාමවල වස් වසා වැඩ සිටිය යුතුයි’’ යනුවෙනි. ‘‘අනුජානාමි භිකඛවෙ වසසානෙ වසසං උපගනතුං’’ යනුවෙන් මහාවග්ග පාලියෙහි වස්සුපනායික ඛන්ධකයෙහි දක්වා ඇත. එදා සිට අද දක්වාම උපසම්පදා භික්ෂූන් වහන්සේලා මෙම වස් විසීමේ චාරිත්‍රය ඉටු කරති. වස් විසූ භික්ෂූන් වහන්සේලා තම වස් ආරක්ෂා කරගෙන තුන්මාසයක් ස්වකීය ආරාමවල ජීවත් විය යුතුයි. මෙම වස් විසීමේ චාරිත්‍රය තුළින් සිදු කරන්නේ භික්ෂූ ජීවිතය හැම පැත්තකින්ම සකස්කර ගැනීමකි. ඒ බව මැනවින් පැහැදිලි වන තැනක්

ලෙස වස් අවසානයෙහි සිදු කරනු ලබන මහා පවාරණය දැක්විය හැක. වස් තුන්මාසය අවසන් වූ පසු වස් විසූ භික්ෂූන් වහන්සේලා සීමාවකට රැස්වී වස් අවසන් කිරීමේ ප්‍රකාශය සිදු කරති.

එම පවාරණ වාක්‍යයෙන් පැහැදිලි කරන්නේ වස් කාලයෙන් පසුවත් තම භික්ෂූ ජීවිතය සකස් කර ගන්නා බවයි. ''සංඝං භනෙත පවාරෙමි. දිටෙඨන වා සුතෙන වා පරිසංකාය වා වදනතු මං ආයසමනෙතා අනුකමපං උපාදාය, පසසනෙතා පටිකරිසසාමි'' එහි තේරුම මෙසේය. ''ස්වාමීනී, අපි හැමෝම වස් කාලය තුළ එකට සමගියෙන් ජීවත් උනෙමු. අද වස් අවසන් කළෙමු. මේ කාලය තුළ මගෙන් වරදක් සිදුවෙනවා දුටුවානම් කෙනෙකුගෙන් ඇසුවානම් සැකයක් හෝ තිබේනම් මට අනුකම්පාකර කියන සේක්වා. මම ඒ වරද හදා ගන්නෙමි.'' මේ පවාරණ වාක්‍යය කොතරම් වටිනා අදහසක්ද ? මේ තුළ කියවෙන්නේ වස් කාලයෙන් පසුවත් තම ජීවිතය සකස්කර ගන්නවා යන පොරොන්දුව දීමකි. මෙම පවාරණයෙන් සිදුකරන පොරොන්දුව ගිහි ගෙදර ජීවත්වෙන දරුවන් වැඩිහිටියන් ඇතුළු හැම දෙනාටම ඉතා වැදගත් වේ. බොහෝ ළමයින් තමාගේ අඩුපාඩුකමක් කෙනෙකු පෙන්වා දෙනවාට කැමති නැත. වැඩිහිටියෝත් බොහෝ විට එසේ කටයුතු කරති. එසේ කරන්නේ සකස් වීමට කැමති නැති අයයි. ඒ නිසා ඉහත සඳහන් කළ පවාරණ වාක්‍යය ගිහි පැවිදි අප හැම දෙනාගේම අවධානයට ලක්කර ගත යුතුය.

මේ සඳහන් කළ වස් විසීමේ චාරිත්‍රය භික්ෂූන් වහන්සේලාට නියම වී තිබෙන චාරිත්‍රයකි. මේ සඳහා ගිහි පින්වතුන්ගේ සම්බන්ධයක් නැත. නමුත් පසු කාලයකදී මේ සඳහා ගිහි දායකත්වය ලැබෙන්නට විය. ඉතිහාසයෙහි සඳහන්වන පරිදි අපේ ඇතැම් රජවරුන් කඨින පිංකම් රාශියක් සිදුකොට ඇති බව වංශකථාවල සඳහන් වේ. මීට අනුගත වෙමින් අද ලංකාවේ බොහෝ පන්සල්වල කඨින පිංකමේදී ගිහියන් ඊට සම්බන්ධවී කටයුතු කරනු දැකිය හැක. එහිදී අද බොහෝ තැන්වල ප්‍රධාන දායකත්වය එක් අයෙකු හිමිකර ගෙන තිබේ. නමුත් පැරණි කාලවල මේ සඳහා ප්‍රධානත්වයක් තිබී නැත. විහාරස්ථානයේ සතර පේරුවේම දායක පින්වතුන් එකට එකතුවී පොදුවේ කරන පින්කමක් ලෙස මේ පින්කම දැක්විය හැක. මේ ලිපිය ලියන අපගේ විහාරස්ථානයේද සිදුකරන්නේද එසේමය. මේ පිංකම පිළිබඳව අපේ ස්වාමීන්වහන්සේලා දේශනා කරන කඨිනානිශංස මේ සඳහා හේතුවී ඇති බව සඳහන් නොකරම බැරිය. විවිධ පාලි මූලාශ්‍ර ඉදිරිපත් කරමින් කරන එම දේශනාවල ඇත්තේ දිව්‍ය ලෝකවල දිව්‍ය සැප සම්පත් මිනිස් ලෝකයෙහි මිනිස් සැපසම්පත් ලැබෙන එකම පිංකම කඨින පිංකම බව පෙන්වා දීමයි. ඒ නිසා සමාජය තුළ මේ සඳහා ලොකු උද්‍යෝගයක් ඇතිවී තිබේ. සමහර පන්සල්වල 2043 දක්වාම කඨින පිංකම භාරගෙන ඇතිබවට ආරංචි ලැබී තිබේ. මෙවැනි උතුම් පිංකමක් සිදුකරනවිට ලෞකික සැප සම්පත් ප්‍රාර්ථනා කිරීම සසර දික් වීමට හේතුවක් වෙයි. ඒ නිසා මෙවැනි පිංකම් කළ යුත්තේ සසර කෙටි කරගෙන නිවන් සැපත උදාකර ගැනීමටයි.

බෞද්ධ භික්ෂුව යනු චාම් සරල ජීවිතයක් ගත කරන පිරිසකි. ඒ භික්ෂූන් සඳහා බුදු පියාණන් වහන්සේ අනුදැන වදාරා ඇත්තේ තුන් සිවුර පමණි. දොපොට සිවුර, තනිපොට සිවුර, අඳනය යනු එම තුන් සිවුරයි. මෙම තුන් සිවුර පරිහරණය කරන භික්ෂූන් පිරිසක් සාකේත නුවර සිට සැවැත් නුවර බලා ගමන් ගති. 30 නමක් පමණ භික්ෂූන් වහන්සේලා බුදුපියාණන් වහන්සේ දැකීමට යන අතර මගදී වැස්සට හසුවිය.

තෙමුණු සිවුරු ඇතිව වැඩමකළ ඒ භික්ෂූන් දුටු බුදු හිමියන් ඊට හේතු විමසූ සේක. තුන් සිවුරෙන් යැපීම ඊට හේතුව බව ප්‍රකාශ කළහ. මෙහිදී තථාගතයන් වහන්සේ කල්පනා කළේ මෙවැනි ආපදාපන්න අවස්ථාවකදී තවත් එක් සිවුරක් තිබුණා නම් එය වැදගත් වන බවයි. ඒ අවශ්‍යතාවය මත දේශනා කළේ වස්වසා වැඩ සිටින භික්ෂුවකට කඨින සිවුරක් පිළිගත හැකි බවයි. මේ සරල වැඩ පිළිවෙල අද සංකීර්ණ වී ඇත. කඨින පිංකම ගැන අර්ථ දක්වන තැන්වල කඨිනය යනු තද, ස්ථිර, ප්‍රබල අදහස් ඇති දෙයක් බවට විස්තර වී ඇත. ඒ සියලු අදහස් කේන්ද්‍ර ගතවී ඇත්තේ කාම ලෝකයට අයත් සැපසම්පත් පිළිබඳවයි. මෙම සදහම් පණිවිඩයෙන් අපේක්ෂා කරන්නේ ගිහි පැවිදි සබඳතාවයේ ප්‍රතිඵලයක්වන මේ කඨින පූජාව සසර කෙටි කරගෙන නිවන් සම්පත උදාකරගත හැකි මහඟු පිංකමක් බව පෙන්වා දීමටයි.

කඨිනය පිළිබඳ මේ නව අර්ථකථන සඳහා අප මූලාශ්‍රය වශයෙන් යොදා ගන්නේ දීඝ නිකායේ, සිගාලෝවාද සූත්‍රයේ එන සදිසා නමස්කාරයයි. බෞද්ධ සමාජ දර්ශනය තුළ ගිහි බෞද්ධයෙකු වටා සමාජ සම්බන්ධතා හයක් ගැන සඳහන් වේ. මව්පියන්, අඹුදරුවන්, ගුරුවරුන්, හිතවතුන්, මහණ බමුණන්, සේවකයන් යනු එම සම්බන්ධතා හයයි. මේ සම්බන්ධතා හයේදී එකිනෙකා අනෙකාට යුතුකම් ඉටු කළ යුතුයි. මේ යුතුකම් ඉටු කිරීම මේ සූත්‍රයේ දක්වා ඇත්තේ දිසා පටිච්ඡාදනය හෙවත්, දිසාව වැසීම වශයෙනි. ඒ ඒ දිසාවන් වැසුණු කල්හි අපට ලැබෙන සමාජමය ශක්තිය ඉතා තදය. ස්ථිරය. අපේ දෙලොවම යහපත්කර ගැනීමට හේතුවක් වේ. ඒ දිසා හයෙන් අපේ මාතෘකාවට අදාල වන්නේ උපරිම දිසාව නම් වූ උඩ දිසාවයි. නැත්නම් ගිහි පැවිදි සම්බන්ධතාවයයි. දහම් පත්‍රිකාවේ මුලටම සඳහන් කොට ඇත්තේ මෙසේ ඔහු විසින් උඩ දිසාව වැසූ කල්හි ක්‍ෂේමවූත්, අප්පටිභයවූත් තත්වයක් උදාවේ යනුවෙනි. මේ වචන දෙක සරලව හඳුනාගත යුතුය. කිසිදු අඩුවක් පාඩුවක් නැති, හැම දෙයින්ම සම්පූර්ණ වූ යන අර්ථයක් ක්‍ෂේම යන වචනයෙන් අදහස් වේ. කිසිදු භයක් තැති ගැනීමක් නැත යන්න අප්පටිභය යන වචනයෙන් අදහස් වේ. මෙය තව දුරටත් හඳුනා ගැනීමට කාන්තාරය යන වචනය ගැන විමසා බලමු. කාන්තාරය යනු කිසිදු දෙයක් නැති හිස් භූමියකි. ගහක් කොළක් නැත. වෙන කිසිදු පහසුකමක් නැත. තිබෙන්නේ හැම පැත්තේම බියකි. තැති ගැනීමකි. එම පරිසරයෙන් ඈත්වී ක්‍ෂේම භූමියකට පැමිණියහොත් කිසිම දෙයක අඩුවක් නැත. සියල්ල සම්පූර්ණ වී ඇත. කිසිදු බියක් තැතිගැනීමක් නැත. සිගාලෝවාද සූත්‍රයේ එන සදිසා නමස්කාරය තුළින්ද කියවෙන්නේ මෙම සමාජ ශක්තියයි.

සදිසා සමාජයෙහි එන උපරිම දිසාව නම් වූ උඩ දිසාව ගැන කියන තැන ගිහියාගෙන් පැවිදි පක්ෂයට යුතුකම් පහක් ඉටුවිය යුතුයයි දක්වන අතර, පැවිදි පක්ෂයෙන් ගිහියාට යුතුකම් හයක් ඉටුවිය යුතු බව කියයි. ගිහියාගෙන් පැවිද්දාට ඉටුවිය යුතු යුතුකම් පහ මෙසේය.

1. මෙතෙතන කාය කමෙමන - මෛත්‍රී සහගත කාය කර්මය

2. මෙතෙතන වචීකමෙමන - මෛත්‍රී සහගත වචීකර්මය

3. මෙතෙතන මනො කමෙමන - මෛත්‍රීය සහගත මනෝකර්මය

4. අනාවට දවාරතාය - නිවසට වඩින භික්ෂූන් හොඳින් පිළිගැනීම

5. ආමිසානුපපදානෙන - භික්ෂුවට සිව්පසයෙන් සැලකීම

අවුරුද්දේ හැමදාම ගිහි පින්වතුන් භික්ෂූන් වහන්සේලාට මේ යුතුකම් පහ ඉටුකරන

බව අපි දනිමු. නමුත් වස් කාලයේදී මේ යුතුකම් මැනවින් ඉටුවේ. සිගාලෝවාද සූත්‍රයට අනුව උපරිම දිසාවෙහි ජීවත්වෙන භික්ෂූන් වහන්සේලා තම දායක පින්වතුන්ට යුතුකම් හයක් ඉටුකරන බව දක්වා ඇත.

1. පාපා නිවාරෙනති - දායකයින් පවින් වළකයි

2. කල්‍යාණෙ නිවෙසෙනති - යහපතෙහි යොදවයි

3. කල්‍යාණෙන මනසා අනුකමෙපනති - හොඳ සිතින් අනුකම්පා කරති

4. අසසුතං සාවෙනති - නො ඇසූ ධර්මය කියා දෙති

5. සූතං පරියොදපෙනති - ඇසූ ධර්මය හොඳින් කියා දෙති

6. සගගසස මගගං ආචිකඛනති - සුගතියට යන මග කියා දෙති

උඩ දිසාව නම්වූ භික්ෂූන් වහන්සේලාට අවුරුද්දේ හැම දිනයකම දායක පින්වතුන්ට මේ යුතුකම් හය ඉටුකරන බව අපි දනිමු. නමුත් වස් තුන්මාසය තුළ වෙනදාට වඩා මේ යුතුකම් ඉටුවෙයි. මෙසේ ගිහි පැවිදි දෙපක්ෂයම ඔවුනොවුන්ට යුතුකම් ඉටුකරන විට උපරිම දිසාව වැසේ. එවිට ගිහි පැවිදි සම්බන්ධය අතර කැඩිය නොහැකි බිඳිය නොහැකි ශක්තියක් උදාවේ. අප මේ කඨින ශක්තිය කියා කියන්නේ එම ගිහි පැවිදි සම්බන්ධතාවයටයි.

ගිහි ඇත්තන් විසින් සම්පාදනය කරන කඨින සිවුර අත ගැස්සවීමේදී යොදාගන්නා කඨින පෙරහැර ගැනද කල්පනාකාරී විය යුතුය. කඨින සිවුරේ ගෞරවය ආරක්ෂාවන පරිදි එම පෙරහැර සංවිධානය විය යුතුය. සමහර තරුණ පිරිස් කඨින පෙරහැරේදී හැසිරෙන ආකාරය සතුටුදායක නැති බවට පැමිණිලි ලැබී තිබේ. එහිදී වැඩිහිටි අය තරුණ පිරිසට කරුණු පැහැදිලි කොට කඨින සිවුරේ ගෞරවය ආරක්ෂාවන ලෙස කටයුතු කළ යුතුය.

කඨින පිංකමේදී සියලු දෙනාගේ ආධාරවලින් සකස්කර ගන්නා සිවුර පෙරහැරින් වැඩමවාගෙන පිංකම දිනයේදී සියලු දායක පින්වතුන් වෙනුවෙන් එක් දායකයෙකු විසින් මහා සංඝයාට සාංඝික කොට පූජා කෙරේ. මහා සංඝරත්නය එම සිවුර පිළිගෙන සීමාවකට ගොස් විනය කර්මයක මාර්ගයෙන් වස්වසා වැඩසිටි භික්ෂූන්ගෙන් එක් නමකට පූජා කරති. එසේ දෙවරක් පූජා කරන්නේ මේ කඨින සිවුර පමණි. එම කඨින සිවුර භාරගන්නා භික්ෂුව එම කඨින සිවුරට කළයුතු උපචාර විධි රාශියක් වෙයි. ඒවා ඉටුකරන විට සිවුර භාරගත් ස්වාමීන් වහන්සේටත්, පිංකමට වැඩමකළ භික්ෂූන් වහන්සේලාටත් දායක පින්වතුන්ටත් මහත් ඵල මහානිශංස ලැබෙන බව දක්වා තිබේ. විශාල මුදලක් වියදම්කොට ලොකු මහන්සියක්වී කරනු ලබන මේ කඨින පිංකම නිසා දිග සසර කෙළවරකොට නිවන් සැප උදාකර ගැනීමට උත්සාහවත් වෙමු.

තෙරුවණ් සරණයි !

මෙම ධර්ම පත්‍රිකාව www.sathyadahama.org යන මෙම වෙබ් අඩවියෙන්ද කියවීමට පහසුකම් සලසා ඇති බව කරුණාවෙන් සලකන්න.